# ගොවීන් ගේ සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්)

සමාජවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

**Samarakoon MT[1] Nisansala LAP[2]**
*Piyumalinisansala7002@gmail.com*

**සංක්ෂිප්තය**

*ග්‍රාමීය ආර්ථිකයේ ප්‍රධාන සාධකයක් වන කෘෂිකර්මාන්තය මගින් මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයේ. මෙම පර්යේෂණය තුළ අරමුණු වූ ඉලක්ක ලෙස ගොවීන් ගේ සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම පෙන්වා දිය හැකිය. තවද සුවිශේෂි අරමුණු ලෙස වෘත්තියක් ලෙස ගොවිතැන තෝරාගැනීම සඳහා බලපාන ලද හේතු සාධක අධ්‍යයනය කිරීම, ග්‍රාමීය ගොවි ජනතාවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා හඳුනා ගැනීම, නූතන ග්‍රාමීය සමාජයෙහි ජීවත් වන ගැමියන් ගේ ජීවන රටාව තුළ දක්නට ලැබෙන ලක්ෂණ හඳුනා ගැනීම ආදි අරමුණු අපේක්ෂා කරමින් අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේනාගම, ගලපිටගල, ගෝනගල, සුහදගම, කුමාරිගම හා රජගම යන ග්‍රාම සේවා වසම් අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් යොදා ගනිමින් සම්මුඛ පරීක්ෂණ උපලේඛනයන් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක මත පදනම්ව සරල අහඹු ක්‍රමවේදය උපයෝගී කරගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් උක්ත ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනයත් සමග ගොවීන් මුහුණ දෙන ගැටලු පිළිබඳ විවරණය කරන ලදී. ගොවීන් නිරන්තරයෙන් මුහුණ දෙන්නා වු වන සතුන් මගින් සිදුවන වගා පාලුව වී සඳහා සහතික මිලක් නොලැබීයාම වත්මන් පරපුර නූතන සමාජ සංස්කෘතික වෙනස්වීමත් සමග ගොවිතැනට විතැන්වීම ආදි කරුණු රැසක් අනාවරණය කර ගන්නා ලදි. ඒ අනුව පෙනී යන්නේ ප්‍රදේශයක ආර්ථික සංවර්ධනයක් සිදු වූවත් ඊට සමගාමීව සමාජීය අවශ්‍යතා මත පදනම්ව සිදුවන සංවර්ධනයක් සිදු නොවීම නිසා ගොවීන් වෘත්තීය වශයෙන් හා සමාජ ආර්ථික වශයෙන් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී ඇති බවයි.*

***මුඛ්‍යය පද- අධ්‍යයනය, ආර්ථිකය, ගොවීන්, සංවර්ධනය***

## හැඳින්වීම

සංවර්ධනය යන සංකීර්ණ අර්ථාන්විත පදය තුළ රටක ආර්ථික, සංස්කෘතික සහ සදාචාරාත්මක ප්‍රගතිය ද ගැබ්ව පවතී. එමෙන්ම සංවර්ධනය යන්නට සරුසාරත්වය, සශ්‍රීකත්වය, සපිරි බව ආදී අර්ථකථනයන් ද සිදුකළ හැකිය. සංවර්ධනය යනු ගුණාත්මක වෙනස්වීමක් වන අතර එය ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය යන අංශයන් මෙන්ම පුද්ගල මනෝභාව සහ ආකල්ප යන අංශ වල ද සිදුවන්නා වූ පරිණාමීය වෙනස්වීමකි. සංවර්ධනයේදී ප්‍රධාන වශයෙන් අංශයන් තුනක් හඳුනාගත හැකිය. එනම් යම් රටක් සංවර්ධනය වී තිබේ නම් එහිදී පුද්ගලයන්ට කිසිම බාධාවකින් තොරව නොමැරී ජීවත්වීමට අවශ්‍යය ඔවුන්ගේ මූලික අවශ්‍යයතා වන ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, ජලය සහ ඖෂධ ආදිය ලබාගැනීමේ හැකියාව තිබිය යුතුය. එමෙන්ම රටේ පුද්ගලයන්ට අනන්‍යතාවයක්, ගෞරවයක්, පිළිගැනීමක් තිබිය යුතුය. තෙවන අංශය නම් රටේ පුද්ගලයන්ට නිදහසේ තමන් කැමති ලෙස දෙයක් තෝරාගැනීමේ හැකියාව තිබිය යුතුය. එමෙන්ම මෙහිදී කිසිම

වහල්භාවයකින් තොරව තමන් කැමති මතවාදයක්, දේශපාලන දර්ශනයක්, දේශපාලන සහභාගීත්වයක් තෝරාගැනීම ද ඇතුළත්ය (හිදැල්ලආරච්චි,2004,43). සංවර්ධනය සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර අද වන විට ලෝකයේ තිරසාර සංවර්ධනය කරා යොමුවී ඇත. සංවර්ධනය නිරතුරුවම වෙනස්වීම් වලට භාජනය වන ගතික හා වර්ධනාත්මක ගුණාංග වලින් යුත් ක්‍රියාවලියකි. අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීම සිදුවිය යුතු අතර තිරසාර සංවර්ධනය සම්පූර්ණ වීමට නම් ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය හා පරිසර සංවර්ධනය යන අංශ තුනම සම්පූර්ණ විය යුතු අතර රටක් තුළ තිරසාර සංවර්ධනය සම්පූර්ණවීම සඳහා ස්වභාවික ප්‍රාග්ධනය, භෞතික ප්‍රාග්ධනය, සමාජ ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය යන සංකල්පයන් ද සම්පූර්ණ විය යුතුවේ. මේ අනුව රටක් තුළ ඒකපුද්ගල ආදායම, භෞතික ජීව දත්ත දර්ශකය, මානව සංවර්ධන දර්ශකය, මානව දරිද්‍රතා දර්ශකය ආදිය තුළින් ගොඩනැගෙන සංවර්ධනය ග්‍රාමීය සහ නාගරික වශයෙන් ක්‍රියාත්මකවී අවසානයේ දී මුලුමහත් රටේම සංවර්ධනය බවට පත්වේ. රටක් නාගරික වශයෙන් මෙන්ම ග්‍රාමීය වශයෙන් ද සංවර්ධනය වීම ඉතාමත් වැදගත් වේ. ඒ අනුව ග්‍රාමීය මට්ටමෙන් සුබසාධන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කොට ඇතත් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාදාමය තුළ සුවිශේෂී ස්ථානයක පසුවන ගොවිජනතාවට ඉන් සිදුවී ඇති සමාජ ආර්ථික සංවර්ධනයෙහි ප්‍රගමනයක් පවතී ද යන්න ගැටලුවක් පැනනගී. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනය කිරීමෙහිලා වරින් වර විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර දිළිඳුකම පිටුදැකීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් දියත් කරන ලද අත්දැකීම් දෙකක් වශයෙන් ජනසවිය සහ සමෘද්ධිය හඳුනාගත හැකිවේ. විනයා කුමාර් 2014 වර්ෂයේ ඔහුගේ *"A Study on Socio- Economic Status of Farmers Practicing Organic Farming in Eastern Dry Zone of Karnataka"* යන ලිපියේ සඳහන් කර ඇති අන්දමට ඔහු ඉන්දියාවේ කර්ණාටක ප්‍රදේශයේ වියළි කලාපය තුළ ගොවියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය පැහැදිලි කර ඇති අතර එහිදී කාබනික පොහොරවල උපයෝගීතාවයන් පිළිබඳ අවධානය යොමු කොට ඇත.එසේ නමුත් ඔහුගේ අවධානය යොමු වී ඇත්තේ ඔවුන්ට ප්‍රධාන ආදායම් මාර්ගය වන කෘෂිකර්මාන්තයට භූමියේ උපයෝගීතාවන් පිළිබඳවයි. මෙම අධ්‍යයනය තුළදීත් දත්ත දායකයින් ගේ රැකියා , කුලය හා තාක්ෂණික උපකරණවල භාවිතය ආදිය පිළිබඳව අවධානය යොමු කොට ඇත (Kumara, 2014,77). කෙසේ නමුත් මෙම පර්යේෂණය තුළදීත් අවධානය යොමු කළ ක්ෂේත්‍රවලට වඩා වැඩි ප්‍රදේශයක් ආවරණය කරමින් ගොවීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳවිශේෂ අවධානයක් යොමු කර ඇත.

ගොවි ජනතාව යනු ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටුකරන පිරිසකි. තම ශ්‍රමය ඉතා සුලු පරිමාණයෙන් සහ භාණ්ඩ උපයෝගී කරගනිමින් සංකීර්ණ ලෙස ගොවිතැන් කළ ගොවීන්, කාර්මික විප්ලවයත් සමග යන්ත්‍ර සූත්‍ර භාවිතය ඇරඹිණි. මේ අනුව තාක්ෂණික අංශයෙන් ඔවුන් ගේ සංවර්ධනයක් සිදු වූ නමුදු සමාජ ආර්ථික වශයෙන් ගොවි ජනතාවගේ සංවර්ධනයක් සිදු වී ද යන්න සමාජයේ ප්‍රබල ලෙස සංවාදයට ලක් වූ කරුණකි. ඒ අනුව ගොවීන් ගේ සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම මෙහිලා ප්‍රධාන අරමුණ විය. සුවිශේෂී අරමුණු වශයෙන්

වෘත්තියක් ලෙස ගොවිතැන තෝරාගැනීම සඳහා බලපාන ලද හේතු සාධක අධ්‍යයනය කිරීම, ග්‍රාමීය ගොවි ජනතාවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතා හඳුනා ගැනීම, නූතන ග්‍රාමීය සමාජයෙහි ජීවත් වන ගැමියන් ගේ ජීවන රටාව තුළ දක්නට ලැබෙන ලක්ෂණ හඳුනා ගැනීම ආදිය පිළිබඳව අවධානය යොමුකරන ලදී.

**ක්‍රමවේදය**

**අධ්‍යයන ක්ෂේත්‍රය**

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කය අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් යොදාගනු ලැබිය. කෘෂිකාර්මික කටයුතු බහුලව සිදුවන ලංකාවේ පළමු ගොවිජන පදය වූ අම්පාර දිස්ත්‍රික්කයේ සේනාගම, ගලපිටගල, ගෝනගල, සුහදගම, කුමාරිගම හා රජගම යන ගම්මාන තුළින් දත්ත දායකයින් 870 දෙනෙකු සරල සසම්භාවී ක්‍රමය යටතේ අහඹු ලෙසට දත්ත දායකයින් තෝරා ගන්නා ලදී.

**දත්ත රැස්කිරීම**

ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන දෙඅංශයෙන්ම ක්ෂේත්‍රයට ගොස් දත්ත සහ තොරතුරු එක්රැස් කරන ලදී.

**ප්‍රාථමික මූලාශ්‍රය**

මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ජා සහ නිරීක්ෂණය යන ක්‍රමවේදයන් ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භාවිතා කරන ලදී.

**ද්විතියීක මූලාශ්‍රය**

මෙම අධ්‍යයනයේ දී පොත් පත් සහ අන්තර්ජාලය ආදිය ද්විතීක මූලාශ්‍රය වශයෙන් භාවිතා කරමින් දත්ත සහ තොරතුරු එක්රැස් කරන ලදී.

**දත්ත විශ්ලේෂණය**

මෙම පර්යේෂණය දෙස අවධානය යොමු කිරීමේදී අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේනාගම, ගලපිටගල, ගෝනගල, සුහදගම, කුමාරිගම යන අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශවල දත්ත දායකයන් ලබා දුන් තොරතුරුවලට අනුව අනාවරණය කරගත් සොයා ගැනීම්වලින් එම ප්‍රදේශවල ගොවීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය පශ්චාත් යුද සමයේදී වර්ධනය වූ ආකාරය හඳුනාගත හැකිය. තිස්වසරක යුද්ධයක නිමාවත් සමග මෙම ප්‍රදේශවල අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම්, රාජ්‍ය පරිපාලන ක්‍රියාවලිය නිසි අන්දමකින් ක්‍රියාත්මක වීමට ආරම්භ වූයේ කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිවල ආගමනයත් සමගය. කෙසේ නමුත් අධ්‍යයනයේ සොයා ගැනිම් දෙස විමසිල්ලෙන් බැලීමේදි විවිධ වයස් මට්ටම්වල දත්ත දායකයන්ගේ ජීවිත විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ක්‍රමික වර්ධනයකට බඳුන් වී ඇති බව පැහැදිලිය.

වගු අංක 01- වයස

| වයස් පරතරය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අවු. 18-22 | 5 | 1% |
| අවු. 23-30 | 58 | 7% |
| අවු. 31-40 | 158 | 17% |
| අවු. 41-50 | 226 | 26% |
| අවු. 51-65 | 285 | 33% |
| අවු. 65 ට වැඩි | 138 | 16% |

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර පර්යේෂණය, 2018)

දත්ත දායකයන් ගෙ වෘත්තින් හා රැකියාවන් පිළිබඳ විමසා බැලීමේදී ප්‍රධාන වශයෙන් ගොවිතැන මූලික කොටගත් ආර්ථික රටාවක් පවතින බව පැහැදිලි වේ.

වගු අංක 02- වෘත්තීය/ රැකියාව

| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ගොවිතැන | 694 | 80% |
| සිවිල් ආරක්ෂක බලකාය | 69 | 8% |
| ව්‍යාපාරික | 5 | 1% |
| රජයේ රැකියා | 40 | 5% |
| පෞද්ගලික අංශයේ රැකියා | 6 | 0.5% |
| ස්වයං රැකියා | 10 | 1% |
| විශ්‍රාමික | 13 | 1% |
| හමුදාව | 8 | 0.5% |
| පොලීසිය | 14 | 2% |
| කුලීවැඩ | 11 | 1% |

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර පර්යේෂණය, 2018)

වී වගාව අම්පාර දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික අර්ථ ක්‍රමයක් වීම ඔවුන් වර්තමානය වන විටත් කෘෂි කර්මාන්තය ප්‍රමුඛ කොටගත් ජීවන රටාවකට හුරුවීමට ප්‍රධාන හේතු සාධකය වී ඇත. එසේම පෙර පැවති යුද සමයේ අවශ්‍යතා මත පදනම්ව සිවිල් ආරක්ෂක බලකාය, පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව ඇතුලුව ආරකෂක අංශයේ රැකියාවලට ද ජනතාව යොමු වී ඇති බව පැහැදිලි වේ. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් අනුව හඳුනාගත හැකි තවත් සුවිශේෂී පැතිකඩක් වනුයේ ප්‍රදේශයේ ජනතාව අමතර ආදායම් ලබාගන්නා මාර්ගයයි. ප්‍රදේශයේ ජනතාව ගේ ගොවිතැන මූලික කොටගත් කෘෂිකර්මාන්තය දෙස අවධානය යොමුකිරීමේදී ඔවුන් වී ගොවිතැන ඉතා ඉහළ මට්ටමකිනුත් හේන් ගොවිතැන හා අනෙකුත් වගාවන් සාපේක්ෂව ඉතා පහළ මට්ටමකිනුත් පවතින බව පැහැදිලි වේ. එමෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය අංශයෙන් ලැබෙන දායකත්වය පහත සඳහන් පරිදි ලැබෙන බව හඳුනාගැනීමට හැකිවිය.

වගු අංක 03- ගොවිතැන්හි ස්වභාවය

| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| වී ගොවිතැන | 840 | 97% |
| හේන් ගොවිතැන | 13% | 1% |
| වෙනත් | 17% | 2% |

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර පර්යේෂණය , 2018)

මෙම පර්යේෂණයේ සොයාගැනීම් වලට අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය අංශයෙන් ලැබෙන දායකත්වය පහත සඳහන් පරිදි ලැබෙන බව හඳුනාගැනීමට හැකිවිය.

වගු අංක 04- කෘෂිකාර්මික කටයුතු උදෙසා රාජ්‍ය අංශයෙන් ලැබෙන දායකත්වය

| සහනාධාර | ඉතා හොඳයි | | හොඳයි | | සාමාන්‍යයි | | දුර්වලයි | | ඉතා දුර්වලයි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පොහොර | 255 | 29% | 428 | 49% | 121 | 14% | 50 | 6% | 16 | 2 |
| බීජ | 34 | 4% | 84 | 10% | 169 | 18% | 294 | 34% | 298 | 34 |
| සහතික මිල | 117 | 13% | 312 | 36% | 174 | 20% | 175 | 20% | 92 | 11 |
| කුඩා ආධාර ඇතුලු වෙනත් පහසුකම් | 9 | 1% | 28 | 4% | 55 | 6% | 187 | 21% | 591 | 68 |

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර පර්යේෂණය, 2018)

පර්යේෂණයට බඳුන් කළ දත්ත ප්‍රදේශවල දත්ත දායකයන් ගේ තොරතුරු අනුව ඒ සඳහා සහතික මිලක් ලබාදීම සම්බන්ධයෙන් නියැඳියේ 36%ක ප්‍රමාණයක් තෘප්තිමත්ව සිටින බව පැහැදිලි වේ. එසේම 29%ක ප්‍රමාණයක් වී සඳහා වී සඳහා සහතික මිල සාමාන්‍යය මට්ටමක පවතින බවටත් ප්‍රකාශ කළ අතර 31%ක පමණ ප්‍රමාණයක් එය ඉතා දුර්වල මට්ටමේ පවතින පෙන්වා දී ඇත. එසේම 13%ක පමණ ප්‍රමාණයක් සහතික මිල ඉතා ප්‍රශස්ථ මට්ටමක පවතින බව සඳහන් කරන ලදී. සමස්ථයක් ලෙස විමසා බැලීමේ දී බහුතරයක් පිරිස වී වල සහතික මිල පිළිබඳ සෑහීමකට පත් නොවන බව මෙමගින් හඳුනාගත හැකිය. සමස්ත පර්යේෂණය දෙස අවධානය දොමු කිරීමේ දී කෘෂිකර්මානතයට අවැසි පරිදි තාක්ෂණික සහ ආර්ථික වශයෙන් ඉහත පර්යේෂණයට බඳුන් කළ ප්‍රදේශ දියුණු වූවත් කෘෂිකර්මානතයට අවශ්‍යය සමාජ ප්‍රගමනය නොලැබී ඇති බව ගොවීන් ගේ වී අස්වනු සඳහා ප්‍රශස්ථ සහතික මිලක් නොලැබී යාමෙන් පැහැදිලි වේ.

මෙම පර්යේෂණයට අනුව අම්පාර දිස්ත්‍රික්කයේ බොහෝමයක් ගොවීන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සමාජීය වශයෙන් පසුගාමී වීමට බලපාන සාධක රැසක් හඳුනාගත හැකිය. වර්තමාන සමාජය තුළ සිදු වූ වේගවත් සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ගොවි ජනතාව සඳහා පෙර තිබූ පිළිගැනීම අහිමි වී යාමක් හඳුනාගත හැකිය. ඊට බලපෑ කරුණු අතර සමාජයේ පවතින ආකල්පයට අනුව ගොවි වෘත්තීය සඳහා ඉතා අවම පිළිගැනීමක් සමාජය තුළ පවතින බව ගුණාත්මක දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය විය. තවද වන සතුන්ගෙන් සිදුවන හානිය නිසා අස්වනු විශාල වශයෙන් හානි වීම කෘෂිකර්මාන්තය සඳහා විශාල බාධාවක් බව දත්ත දායකයින් පෙන්වා දෙන ලදී. තවද පෙර සඳහන් කළ පරිදි වගාවට හානි කරන ප්‍රධානම වන ජීවියෙකු වන වල් අලින්ගෙන් සිදුවන හානිය සඳහා වගකිව යුතු රාජ්‍යය ආයතන හා නිළධාරීන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම කෘෂිකර්මාන්තයට විශාල කරදරයක් වී ඇති බව හඳුනාගත හැකිය.

**සාරාංශය**

අම්පාර දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ කිහිපයක් ඇසුරු කොට ගනිමින් සිදු කළ මෙම අධ්‍යයනයේදී අම්පාර දිස්ත්‍රික්කය පශ්චාත් යුද සමයේදී සීඝ්‍ර දියුණුවකට ලක් වී ඇති අතර ඊට සාපේක්ෂව කෘෂිකර්මාන්තය ද ඉහළ සංවර්ධනයක් ලබා ඇත. පාරම්පරිකව කෘෂිකර්මාන්තය තම ජීවන උපාය කරගත් ගොවි පවුල හා ගොවීන් වාසය කිරීමත් රටට අවශ්‍යය වී සැපයුම කරන ප්‍රධාන මධ්‍යස්ථානයක් වීමත් නිසා අම්පාර දිස්ත්‍රික්කය අදටත් කෘෂිකර්මාන්තය ඉහළ ස්ථානයක වැජඹේ. කෙසේ නමුත් වර්තමාන සමාජ සංස්කෘතික වෙනස් වීමත් සමග නූතන පරපුර කෘෂිකර්මාන්තයෙන් ඈත් වීමත් , වන සතුන්ගෙන් වන වගා හානිවීමත්, වී සඳහා ස්ථාවර මිලක් නොලැබීමත් නිසා මෙම ප්‍රදේශවල ගොවීන් සමාජ, ආර්ථික සංවර්ධනය අසමතුලිත වී ඇත. එසේම ජලය සපයා ගැනීම ගැටලු ආදී මූලික පහසුකම් අවම වීමත් හේතු කොට ගෙන මෙම ප්‍රදේශවල කෘෂිකර්මාන්තය දැඩි අසීරුතාවකට ලක්ව ඇත. මෙම ප්‍රදේශවල කඩිනමින් සිදු වූ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිඵලයක් වශයෙන්

කෘෂිකර්මාන්තයට අවශ්‍ය පහසුකම් යම්තාක් දුරකට දියුණු වූ බව සුළුතරයක් පිරිස විශ්වාස කළත් සංවර්ධනයට අවශ්‍ය මූලික පරිපූරකයක් වන සමාජීය සාධක සඳහා ප්‍රමුඛතා ලැබී නොමැති බව පෙනී යයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


නානායක්කාර, එස්. (1999). **මානව සංවර්ධනය තුළින් ඵලදායිතාව වර්ධනය**. කොළඹ: මත්පැන් හා මත්ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඒකකය.

විජේසිංහ, එම්. එල්. (1999). **පුද්ගල සංවර්ධනය හා සංවර්ධනාත්මක සන්නිවේදනය.** මහරගම: කර්තෘ ප්‍රකාශන.

හිඳැල්ල ආරච්චි, සී. සී. (2004). **සංවර්ධන අධ්‍යයනය**. නුගේගොඩ: සරසවි.

හිරන්‍යා, ඩී. (1938). **ගැමි සංවර්ධන සැලසුම්කරණය.** මවුන්ට් ලැවේනියා: අර්ථ චර්යා පදනම.

ගජනායක, ජය. (1990). **ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම**. කොළඹ; කොළඹ විශ්වවිද්‍යාලය.

https://www.sciencedirect.com/science/article/abs/pii/S0264837712000087